**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**2022 වර්ෂය සඳහා ආපනශාලා, සේවාවන් සැපයීම සඳහා අයදුම්පත් කැඳවීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට 2022 වර්ෂය තුළ දී පහත සඳහන් ආපනශාලා සේවාවන් සැපයීම සඳහා පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2022.08.16 දින සිට 2022.08.23 **දින** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

ආපසු නොගෙවන රු 1,000.00 ක ගාස්තුවක් විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා අයදුම්පත් සහ විස්තර පත්‍රිකා 2022.08.16 දින සිට 2022.08.22 දින දක්වා වැඩ කරන දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සරප් අංශයෙන් ලබා ගත හැකිය. නිසිලෙස සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2022.08.23 දින  ප.ව 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය  විශ්වවිද්‍යාලය, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ  ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ලංසු බහාලුමේ තැන්පත් කිරීම කළ යුතුය. අදාළ අයදුම්පත් එදිනම ප.ව 1.00 ට විවෘත කරනු ලැබේ. ලංසු පත්‍රිකා බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"විශ්වවිද්‍යාල ආපනශාලා, සේවාවන් පවත්වාගෙන යාම සඳහා අයදුම්පත් කැඳවීම,** 2022- GSD/SER/2022**"** වශයෙන් සඳහන් කර ඉල්ලුම් කරන ආපන ශාලාවේ නම සඳහන් කිරීම අනිවාර්ය වේ.

සේවාව අවශ්‍ය කරන ආපනශාලා පහත දක්වා ඇත.

01. අක්බාර් නෙල් ආපන ශාලාව
02. පශු වෛද්‍ය පීඨ ආපන ශාලාව
03. පශු සායනික විද්‍යා අංශ ආපන ශාලාව
04. ඉංජිනේරු පීඨ ආපන ශාලාව I
05. ලලිත් ඇතුලත්මුදලි ශාලා ආපන ශාලාව

ආපනශාලා සේවාවන් සැපයීමේදී ගොඩනැගිලි සඳහා කුලියක් අය කරනු නොලැබේ. ජලය නොමිලේ සපයනු ලැබේ. තවද ආපනශාලාවල  විශාලත්වය අනුව සෑම මාසයක් සඳහාම සහන විදුලි ඒකක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය මගින් ලබාදෙන අතර, ඒ සඳහා රජයේ ගැසට් පත්‍රය අනුව ගෙවිය යුතු ස්ථාවර ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය.  ආපනශාලා පවත්වාගෙන යනු ලබන කොන්ත්‍රාත්කරුවන්ට පමණක් සීමාසහිතව ආපනශාලාවල නැවතීමේ පහසුකම් සලසා ඇත.

මෙම සේවාවන් සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්/මිල ගණන් සලකා බැලීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ කිසිදු හේතු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ බලය විශ්ව විද්‍යාලය සතු වේ.

වැඩි විස්තර සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,  සාමාන්‍ය සේවා අංශය.
081- 2392438          081-2392436

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව
පේරාදෙණිය  විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

